දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெகஸ ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல )FHB/AH/TP/2014
My No )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2015-07-02
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம் மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health & Indigenous Medicine

පොදු චක්‍රලේක අංකය 01 - 25 /2015

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු,
සියලුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරු,
සියලුම අධ්‍යක්‍ෂවරු/ සෞඛ්‍ය ආයතන භාර නිලධාරීන්,
සියලුම විශේෂ වැඩසටහන් භාර අධ්‍යක්‍ෂවරු,
ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්‍ෂ,
සියලුම මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, කොළඹ මහ නගර සභාව,
සියලුම වෛද්‍ය නිලධාරීන්,
සියලුම විද්වත් වෘත්තියමය සංගම් වල සභාපතිවරු,

## <u>යෞවනයන් සඳහා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම</u>

මෙම චක්‍රලේඛය නිකුත් කෙරෙනුයේ 07/03/2013 දින නිකුත්වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල් තුමාගේ පොදු චක්‍රලේක අංක 02-29/2011 ට වැඩිමනත් වශයෙනි. ලංකාවේ ජනගහණයෙන් පහෙන් එකක් නියෝජනය කරනුයේ නව යෞවනයන්ය.

නව යොවුන් විය යනු ගවේෂණ සහ අත්හදා බැලීම් කරන සමයකි. නව යෞවනයන් විවිධ අවදානම් හැසිරීම් වල නියැලීමේ ප්‍රතිඵලයක් ලෙස බලාපොරොත්තු රහිත අනවශ්‍ය ප්‍රතිවිපාක අත්වේ. වගකීමක් සහිත ඵලදායි සෞඛ්‍ය සම්පන්න වැඩිහිටියෙකු බවට පත්වීම සමාජය නව යෞවනයාගෙන් අපේක්‍ෂා කරයි. නව යෞවනයන් බහුතරයක් සමාජ සාරධර්ම සහ සංස්කෘතීන්ට ගරු කරමින් අපගේ අපේක්‍ෂා සපුරාලයි. කෙසේ වෙතත් ද්විතියික හා තෘතියික නිවාරන ප්‍රයත්නයක් අවශ්‍ය විශේෂ අවධානයට යොමු විය යුතු සුළුතරයක්ද සිටී.

යෞවනයන් සඳහා සෞඛ්‍ය සේවා සැපයීමේදී නිරීක්‍ෂිත ගැටළු හා නීතිමය පැත්ත පිළිබඳ පැහැදිලි කිරීමක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ඇත.

නීතිපති දෙපාර්තමේන්තුව මගින්, 28-05-2015 දින නිකුත් කළ යොමු අංක CH/CM3/ 533/10 හා 26-01-2015 දින නිකුත් කළ යොමු අංක E-100/2014 ලිපි මගින් ඉස්මතු කළ පහත සඳහන් කරුණු ගැන ඔබේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන අවුරුදු 16 ට අඩු නව යෞවනයන් පිළිබඳව හෝ ඔවුන් ගැබ් ගෙන ඇති බව දැනගත් විට හෝ එය ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් ලෙස සලකා දැනුම් දීමට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 21 වෙනි වගන්තිය ප්‍රකාරව වෛද්‍ය නිලධාරීන් ඇතුළු සෞඛ්‍ය සේවකයින් නීතියෙන් බැඳී නොමැති බවත්, එබැවින් දණ්ඩ නීති සංග්‍රහයේ 199 වෙනි වගන්තිය අනුව එය දඬුවම් ලැබිය යුතු වරදක් නොවන බවත් පෙන්වා දී ඇත.
යෞවනයන්ට ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් සැපයීමේදී වෛද්‍ය නිලධාරීන් ප්‍රධාන වශයෙන්ම "දරුවාගේ උපරිම යහපත" සලකා බැලිය යුතුය. "දරුවාගේ උපරිම යහපත" යන්න තක්සේරු කර සිද්ධියෙන් සිද්ධියට වෙන වෙනම බලා තීරණ ගත යුතුයි.

උදාහරණයක් ලෙස යම් වෛද්‍ය නිලධාරියෙකුට අඩුවයස් සේවාලාභියෙකු වෙත ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීමේදී, (වයස අවු 18 ට අඩු) එම සේවාලාභියා ලිංගික සංසර්ගයක් හෝ ලිංගික සම්බන්ධතාවයක් ආරම්භ කිරීමට හෝ දිගින් දිගටම එවැන්නක යෙදීමේ අවදානමක් තිබේද යන්න තක්සේරුකර, එවැනි අවස්ථාවකදී ප්‍රජනක සෞඛ්‍ය සේවා ලබා නොදීම නිසා එම අඩුවයස් සේවා ලාභියාට ඇතිවිය හැකි කායික හා මානසික ගැටළු ගැන සලකා බැලිය යුතුය. කෙසේ වෙතත් වෛද්‍ය නිලධාරීන්ට මව් පියන්ගේ / භාරකරුවන්ගේ කැමැත්ත ලබාගැනීමට සාධාරණ උත්සාහයක් දැරිය යුතු අතර එසේ කැමැත්ත ලබා ගැනීමට නොහැකි අවස්ථා වලදී සේවා ලාභියාගේ උපරිම යහපත සලකා ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම කළ හැක.

යෞවනයන් සඳහා සපයන ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා යනුවෙන් මෙහි අර්ථ දැක්වෙන්නේ: පූර්ව ගර්භණී සංරක්ෂණය, ගර්භණී රැකවරණය, (මාතෘ සංරක්ෂණය): ප්‍රසව සංරක්ෂණය: පසු ප්‍රසව සංරක්ෂණය : උපත් පාලනය/පවුල් සංවිධාන සේවාව: පසු ගබ්සා සංරක්ෂණය, ලිංගිකව බෝවන රෝග හා HIV / AIDS රෝග වැළැක්වීම හා ප්‍රතිකාර කිරීම: ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආශ්‍රිත හිංසනය වැළැක්වීම අවම කිරීම සහ වින්දිතයන්ට සහන සැලසීම වේ.

අප රටේ නව යෞවනයන්ට ගුණාත්මක යොවුන් මිතුරු සුව සේවාවක් සැපයීම සඳහා ඔබ විසින් දෙන සහයෝගයට අප කෘතඥ වෙමු. වැඩි විස්තර සඳහා යෞවනයින්ට ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීමේ මාර්ගෝපදේශය බලන්න. අදාල තොරතුරු පවුල් සෞඛ්‍ය කාර්යාංශයෙන් ලබා ගත හැක. (දුරකථන අංක 2692746).

ස්තුතියි.

වෛද්‍ය පී. පී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
385, "සුවසිරිපාය"
පූජ්‍ය බද්දේගම [illegible] හිමි මාවත,

වෛද්‍ය පී පී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
ලේකම්/සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට